# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 4 දරන
# ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත

---

[සහතිකය සටහන් කළේ 1986 පෙබරවාරි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 පෙබරවාරි මස 21 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ** II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

**මිළ : ශත 45 යි** තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත

[සහතිකය සටහන් කළේ 1986 පෙබරවාරි මස 18 වන දින.]

එල්. ඩී.—ඕ. 53/85

**හිටපු ජනාධිපතිවරයන්ට සහ හිටපු ජනාධිපතිවරයන්ගේ වැන්දඹුවන්ට නිල නිවාස සහ වෙනත් දීමනා සහ පහසුකම් ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද එවැනි වැන්දඹුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඩු නාමය.*

1. මේ පනත 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*නිවාස සැපයීම.*

2. සෑම හිටපු ජනාධිපතිවරයකුට ම සහ හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවකට ම ඔහුගේ හෝ ඇගේ ජීවිත කාලය තුළ වාසය සඳහා උචිත නිවාසයක් නිවාස කුලියෙන් තොරව සැපයිය යුතු ය:

එසේ වුවද යම්කිසි හේතුවක් නිසා ඒ හිටපු ජනාධිපතිවරයාගේ හෝ ඒ හිටපු ජනාධිපතිවරයාගේ වැන්දඹුවගේ හෝ වාසය සඳහා උචිත නිවාසයක් නොසපයන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ හිටපු ජනාධිපතිවරයාට හෝ ඒ හිටපු ජනාධිපතිවරයාගේ වැන්දඹුවට හෝ ගෙවිය යුතු මාසික විශ්‍රාම වැටුපෙන් තුනෙන් එකකට සමාන මාසික දීමනාවක් ඒ හිටපු ජනාධිපතිවරයාට හෝ ඒ හිටපු ජනාධිපතිවරයාගේ වැන්දඹුවට හෝ ගෙවිය යුතු ය.

*ලේකම් දීමනා ගෙවීම සහ නිල ප්‍රවාහන සහ වෙනත් පහසුකම් සැලසීම.*

3. (1) (අ) ජනාධිපතිවරයාගේ පෞද්ගලික ලේකම් ධුරය දරන තැනැත්තාට තත්කාලයේ ගෙවනු ලබන මාසික වැටුපට සමාන මාසික ලේකම් දීමනාවක් සෑම හිටපු ජනාධිපතිවරයකුට ම ගෙවිය යුතු ය; තවද

(ආ) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ පෞද්ගලික ලේකම් ධුරය දරන තැනැත්තකුට තත්කාලයේ ගෙවනු ලබන මාසික වැටුපට සමාන මාසික ලේකම් දීමනාවක් හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවට ගෙවිය යුතු ය.

(2) සෑම හිටපු ජනාධිපතිවරයකුට ම සහ සෑම හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවකට, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුට තත්කාලයේ සපයනු ලබන නිල ප්‍රවාහන සහ වෙනත් සියලු පහසුකම් සලසනු ලැබිය යුතු ය.

*හිටපු ජනාධිපතිවරයකුගේ වැන්දඹුවට විශ්‍රාම වැටුප් ගෙවීම.*

4. හිටපු ජනාධිපතිවරයකු මියගිය අවස්ථාවේ දී ඔහුට ලැබීමට හිමිකම තිබූ හෝ ජනාධිපති ධුරය දැරීම නතර වූ අවස්ථාවේ දී ඒ හිටපු ජනාධිපතිවරයාට ලැබෙන්නට හිමිකම තිබූ, මාසික විශ්‍රාම වැටුපෙන් තුනෙන් දෙකකට සමාන මාසික විශ්‍රාම වැටුපක් ඒ හිටපු ජනාධිපතිවරයාගේ වැන්දඹුවට ඇගේ ජීවිත කාලය තුළ දී ගෙවිය යුතු ය.

ඉ—ඒ 055182—6,730 (86/01)

ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීම.

5. මේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සහ දීමනා ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

අර්ථ නිරූපණය.

6. මේ පනතෙහි —

"විශ්‍රාම වැටුප" යන්න හිටපු ජනාධිපතිවරයකු සම්බන්ධයෙන් යෙදුන විට ඒ හිටපු ජනාධිපතිවරයා ජනාධිපති ධුරය දරා තිබීමේ හේතුවෙන් ඔහුට ලැබීමට හිමිකම් ඇති විශ්‍රාම වැටුප එයින් අදහස් වේ;

"ජනාධිපතිවරයා" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ;

"වැන්දඹු" යන්නට වැන්දඹු පුරුෂයෙක් ද ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ පත්‍රික කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. [illegible] කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.